අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/04/60/01/වා.ස්.මා.(2025)
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2025.02. 28

අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ - 12/2025

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු
ජාතික පාසල් විදුහල්පතිවරු

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ (ජාතික පාසල්හි සේවයේ නියුතු) නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු පටිපාටිය-2025**

ජාතික පාසල්හි සේවය කරන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධරයන් සඳහා වන වාර්ෂික ස්ථානමාරු පටිපාටියට අනුව වාර්ෂික ස්ථාන මාරු අයඳුම්පත් කැඳවනු ලැබේ.

(අ) වාර්ෂික ස්ථාන මාරු
ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන නිලධරයන්ගේ ඉල්ලීම් ඉටු කිරීම සඳහා වාර්ෂික ස්ථානමාරු මණ්ඩල ක්‍රියාත්මක කෙරේ.

(ආ) වාර්ෂික නොවන ස්ථාන මාරු
වාර්ෂික ස්ථාන මාරුවලට අමතරව දෛනික කාර්යයක් ලෙස ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ස්ථාන මාරුවීම් සිදු නොකරන අතර සේවා අවශ්‍යතාවය සහ විනය හේතු මත අදාල පත්වීම්/විනය බලධරයා විසින් ස්ථානමාරු නියෝග නිකුත් කරනු ලැබේ. මීට අමතරව සුහද ස්ථානමාරු ඉල්ලීම්ද, නිලධරයන්ගේ සානුකම්පිතව සළකා බැලිය යුතුවූ සහ හදිසි ඉල්ලීම් ආයතන ප්‍රධානියාගේ නිරීක්ෂණ සහ නිර්දේශ සහිතව ඉදිරිපත් කරන විට ඒ පිළිබඳව ද සළකා බලා අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

2. වාර්ෂික ස්ථානමාරු සඳහා යටත්වන නිලධරයන්

2.1. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධරයන් කිසියම් ජාතික පාසලක අවම වශයෙන් වසර 03ක් වත් සේවය කර තිබීම ස්ථාන මාරුවක් සඳහා අයදුම් කිරීමට සුදුසුකමක් වේ.

අ) ජාතික පාසල්හි ස්ථිර විදුහල්පති වශයෙන් පත් කර ඇති නිලධාරීන් ඇතුළුව එකම සේවා ස්ථානයක අඛණ්ඩව වසර 06 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ජාතික පාසල්වල සේවය කරන සියලුම නිලධාරීන් අනිවාර්යයෙන් ස්ථාන මාරුවීම සඳහා යටත් වේ. එවැනි නිලධාරීන් අයදුම්පත් ඉදිරිපත් නොකළ ද වාර්ෂික ස්ථාන මාරු සඳහා සලකා බලනු ලැබේ.

ආ) වාර්ෂික ස්ථාන මාරු සිදු කිරීමේදී සම්මුඛ පරීක්ෂණ මගින් පත් කරන ලද ජාතික පාසල්හි විදුහල්පති සේවයේ ස්ථිර විදුහල්පතිවරු අතර ස්ථාන මාරුවීම් සඳහා ප්‍රමුඛතාවය හිමිවේ. තවද ජාතික පාසල්හි ස්ථිර විදුහල්පති තනතුරුවල ඇතිවන පුරප්පාඩු සඳහා වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය අනුව ස්ථාන මාරු කරනු නොලැබේ.

2.2. ස්ථාන මාරු ඉල්ලුම් කරන හා ස්ථාන මාරුවලට යටත්වන නිලධරයන් තමන් ස්ථාන මාරු ලැබීමට කැමති පාසල් තුනක් සඳහන් කරමින් ස්ථාන මාරුවීම් අයදුම්පත්‍රයක් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ඉදිරිපත් කළ යුතුය. එසේ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළහොත් එහි සඳහන් පාසලට මාරුවීම ලබාදීමට උත්සාහ දරන අතර ඉල්ලා ඇති පාසලට මාරුවීම ලබාදීමට නොහැකි වුවහොත් මාරුවීම් මණ්ඩලයේ අභිමතය පරිදි ඔවුන්ට වෙනත් පාසලක් ලබා දෙනු ඇත.

2.3. ස්ථාන මාරුවීම් ලබා දීමේදී එකම පාසලක වැඩිම සේවා කාලයක් සහිත නිලධරයන් සඳහා ප්‍රමුඛතාවය ලබා දේ.

2.4. භාර්යාව සහ ස්වාමි පුරුෂයා යන දෙදෙනාම රාජ්‍ය සේවයේ නියුක්ත අය නම් එම දෙදෙනාටම ඔවුන්ගේ ඉල්ලීම අනුව එකම ප්‍රදේශයක සේවය කරන්නට ඉඩ ලබාදීමට මාරු මණ්ඩල සෑම උත්සාහයක්ම දැරිය යුතුය. කෙසේ වුවද එකම සේවා ස්ථානයක භාර්යාවට සහ ස්වාමි පුරුෂයාට සේවය කිරීමේ අවස්ථාව ලබා නොදෙනු ඇත.

2.5. වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත් නොවන නිලධරයන්

(අ) නිලධරයාගේ ඉල්ලීම හෝ වෙනත් විශේෂිත කරුණු මත (විනය හා සේවා අවශ්‍යතාවය) හැරුනුකොට 2024 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 58 ඉක්මවූ නිලධරයන් දැනට සේවය කරනු ලබන කලාපයෙන් පිටතට මාරු නොකළ යුතුය.

(ආ) කෙසේ වුවද, විනය හා සේවා අවශ්‍යතාවය මත පාසලේ ශිෂ්‍යයන්ගේ අධ්‍යාපන අභිවෘද්ධිය පෙරදැරි කරගෙන වයස අවුරුදු 58 ඉක්මවූ නිලධරයන්ටද ස්ථානමාරුවීම් ලබාදිය හැකිය. එසේම, 2024 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 58 ඉක්මවූ නිලධරයන් ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි කලාපය තුල වුවද ස්ථාන මාරු නොකල යුතුය.

2.6. පාසල් යන දරුවන්, ආබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක්තැන්ව සිටින කලත්‍රයන් සහ කලත්‍රයා දීර්ඝ කාලීනව විදේශ ගතව සිටින අවස්ථාවන් වැනි පිළිගත හැකි කරුණු සහිතව තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ පාසල් ප්‍රධානියාගේ නිර්දේශයන්ද සමග ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳව සැලකිල්ලට ගෙන කටයුතු කළ යුතුය.

2.7. යම් කිසි ලියාපදිංචි වෘත්තීය සමිතියක මව් සංගමයේ සභාපති/ලේකම්/භාණ්ඩාගාරික හා මධ්‍යම විධායක මණ්ඩලයේ සභිකයින් මාරු කරන්නේ නම් අදාළ වෘත්තීය සංගමයේ ලේකම්ගේ නිර්දේශය සැලකිල්ලට ගෙන සංගමයේ කටයුතුවලට බාධා නොවන ස්ථානයකට මාරු කළ යුතුය. මෙම ස්ථාන මාරු කාර්ය පටිපාටියේදී වෘත්තීය සංගමය යනුවෙන් හැඳින්වෙන්නේ ශ්‍රී ලංකා විදුහල්පති සේවාවේ නිලධරයන්ගෙන් සමන්විත වෘත්තීය සමිති වේ. ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7 වගන්තිය යටතේ වන අනුග්‍රහයන් ලබා ගැනීමට අපේක්ෂා කරන සියළුම වෘත්තීය සමිති තම වෘත්තීය සමිති නිලධරයන් පිළිබඳ විස්තර 5:15 වගන්තියේ ප්‍රකාර අදාළ මාරුවීම් බලධාරියා වෙත මාරු මණ්ඩල කටයුතු ආරම්භ කිරීමට පෙර ඉදිරිපත් කළ යුතු වේ.

3. වාර්ෂික ස්ථාන මාරු කමිටුව

3.1. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ කාර්යභාරය

i. වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කැඳවීමෙන් පසු මෙම ස්ථාන මාරු නියෝග නිකුත් වන තෙක් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති හි වගන්ති අංක 246 - IVයටතේ කරනු ලබන ස්ථාන මාරුවීම් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වගන්ති අංක 268 හි වන සුවිශේෂී අවස්ථාවකදී හැරුණු විට නතර කරනු ලැබේ.

ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති හි XVIII පරිච්ඡේදයේ විධිවිධානවලට සහ මෙම ස්ථාන මාරු පටිපාටියේ දැක්වෙන කරුණුවලට යටත්ව 253 (I,II) වගන්තිවලට අනුව ක්‍රියා කරමින් ඉහත (1).අ. ඡේදයේ සඳහන් අවස්ථාවලදී අධ්‍යාපන ලේකම්ට නිර්දේශ ලබාදීම වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ කාර්යභාරය වේ.

3.2 පහත සඳහන් වාර්ෂික ස්ථාන මාරු කමිටු පිහිටුවනු ලැබේ.

(i) ජාතික පාසල් විදුහල්පති ශ්‍රේණිධාරී මාරු මණ්ඩලය

3.3 ජාතික පාසල් විදුහල්පති ශ්‍රේණිධාරී මාරු මණ්ඩලයේ සංයුතිය

(i) ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ - සභාපති
(ii) සහකාර ලේකම් - විදුහල්පති ශාඛාව
(iii) සක්‍රිය සේවයේ යෙදී සිටින විදුහල්පති සේවයේ නිලධාරීන්ගෙන්15% ක හෝ ඊට වඩා වැඩි නිලධාරී නියෝජනයක් ඇති සෑම විදුහල්පති වෘත්තීය සමිතියකින්ම නම් කළ නියෝජිතයෙකු (එක් පුද්ගලයකුට වෘත්තීය සමිතිය වෙනුවෙන් මාරු මණ්ඩලය සඳහා අඛණ්ඩව වසර 03කට වඩා සහභාගී විය නොහැක.)

4. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව

4.1. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු සංයුතිය.

(i) අමාත්‍යාංශයේ ලේකම් / අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු
(ii) මාරු මණ්ඩලය නියෝජනය කරන ලද එක් නිලධරයකු
(iii) අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරන ලද ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයෙකු

4.2. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සම්බන්ධයෙන් කෙරෙන අභියාචනා සළකා බැලීම සඳහා වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පිහිටුවනු ලබන අතර එමගින් පහත කරුණු පරීක්ෂා කර තීරණ ලබා දෙනු ඇත.

I. වාර්ෂික ස්ථාන මාරු පටිපාටියට අනුකූල නොවන පරිදි කරන ලද ස්ථාන මාරුවීම්
II. නිලධරයන්ගේ ඉල්ලීම් අභිබවා සිදුකරන ලද ස්ථාන මාරුවීම් ( සේවා අවශ්‍යතාවය මත සිදුකරන ලද ස්ථානමාරුවීම් පිළිබඳ අභියාචනා මෙහිදී සලකා බලනු නොලැබේ. )
III. ස්ථාන මාරුවීම් අයදුම් කරන ලද දිනෙන් පසුව නිලධරයන්ට සිදුවූ හදිසි විපත් කරදර අසනීප වැනි සානුකම්පිත තත්ත්වයන් පිළිබඳව පිළිගත හැකි නිර්දේශ ඉදිරිපත් කර ඇත්නම් ඒවා පිළිබඳ සළකා බැලීම.

5. වාර්ෂික ස්ථාන මාරු ලබාදීමේදී සැළකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු

5.1. ප්‍රියමනාප/ ඉතා ප්‍රියමනාප පාසල්වල සේවය කරන නිලධරයන් විසින් නැවත ප්‍රියමනාප ස්ථානයකට කරනු ලබන මාරු ඉල්ලීම් සළකා බලනු ලබන්නේ එම සේවා ස්ථානවලට ප්‍රියමනාප නොවන සේවා ස්ථානවල සේවය කරන නිලධරයන් විසින් කරනු ලබන ඉල්ලීම් සළකා බැලීමෙන් පසුවය. ප්‍රියමනාප සේවා ස්ථානවල සේවය කල කාලය ගණනය කිරීමේදී පූර්වාසන්න වසර 10 තුල සේවය කළ ප්‍රියමනාප සේවා ස්ථාන කිහිපයක වුවද එම සේවා කාලයන්හි එකතුව ගණන් ගනු ලැබේ.

5.2. යම් නිලධරයකුගේ කලත්‍රයා පොලිසියේ හෝ ත්‍රිවිධ හමුදාවේ උතුරු නැගෙනහිර ක්‍රියාත්මක රාජකාරිවලදී ආබාධිත තත්ත්වයට පත්ව ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් කළ යුතු වන්නේ ඔවුන්ගේ ඉල්ලීම් අනුව පමණි. එසේම එවැනි නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් ඉල්ලීම් පිළිබඳව ප්‍රමුඛත්වය දැක්විය යුතු වේ. මෙවැනි නිලධරයන් ප්‍රියමනාප සේවා ස්ථානයකින් පිටතට ස්ථාන මාරු කිරීමට සිදු වන්නේ නම් ඊට ආසන්නතම පාසලට හෝ නිලධරයාගේ ඉල්ලීමට අනුව අදාළ පාසලට මාරු කළ යුතුය.

5.3. වාර්ෂික ස්ථාන මාරු කමිටුව විසින් නිලධරයන් මාරු කිරීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත විදුහල්පති කාර්ය මණ්ඩලයේ කණිෂ්ඨ/ ජ්‍යෙෂ්ඨතාවයේ සමබරතාවය රැකීමටද සෑම විටම උත්සාහ කළ යුතුය.

5.4. වාර්ෂික ස්ථානමාරු පරිපාටියෙහි 2.1 ඡේදය යටතට ගැනෙන නිලධරයකු වෙනත් ස්ථානයකට මාරුවීමට ඉල්ලා ඇති විටක, එම ඉල්ලීම ඉටු කිරීම සඳහා එහි 2.2 ඡේදයේ අවශ්‍යතා සපුරා ඇති එම ස්ථානයේ වැඩිම සේවා කාලයක් සහිත නිලධරයන් ඉන් පිටතට මාරු කළ හැකිය.

5.5. එකම සේවා ස්ථානයේ සේවා කාලය වසර 06 කට නොවැඩි නිලධරයකු විසින් කරන ලද ඉල්ලීමකට අනුව ස්ථාන මාරුවීමක් ලබාදී ඇති විටක එම නිලධරයා විසින්ම එම ස්ථාන මාරුවීම අවලංගු කර ගැනීම සඳහා ඉල්ලීමක් කොට එය අවලංගු කර ගන්නේ නම් (ඉතාම සාධාරණ ඉල්ලීමකට හැර) ඉදිරි වසර 3 ක් දක්වා ඔහුට/ඇයට ස්ථාන මාරුවීම් සඳහා ඇති හිමිකම් අහිමි වේ.

5.6. ප්‍රියමනාප සේවා ස්ථානවල වසර 5 ට වඩා සේවය කළ නිලධරයන්ගේ නාම ලේඛණයක් ඔවුන්ගේ වයස, සේවා කාලය, පදිංචි ප්‍රදේශය, ස්ථානමාරු කළහොත් මාරුවී යාමට වඩාත් කැමති ස්ථාන 3 ක්, යනාදී සියළු තොරතුරු අදාළ ආකෘතියෙන් නිවැරදිව සම්පූර්ණ කර අධ්‍යාපන ලේකම් වෙත සෑම වර්ෂයකම ජුනි 30 දිනට පෙර අදාළ විදුහල්පතිවරුන් විසින් එවිය යුතුය.

5.7. ඒ අනුව එම නිලධරයන් පාසලෙන් පිටතට මාරු කර ඒ හා සම නිලධරයන් සංඛ්‍යාවක් පාසල වෙත ස්ථාන මාරු කිරීමට කටයුතු කරනු ලැබේ.

5.8. ප්‍රිය මනාප නොවන සේවා ස්ථානයක සේවය කළ නිලධරයකු ස්ථාන මාරුවීමක් ඉල්ලූ විට එම ඉල්ලීම ඉටු කිරීමට මෙහි 5.6 වගන්තියේ අවශ්‍යතා සපුරා ඇති එකී ස්ථානයේ වැඩිම සේවා කාලයක් සහිත නිලධරයා ඉන් පිටතට මාරු කළ හැකිය.

5.9. ප්‍රියමනාප සේවා ස්ථානවලට ස්ථාන මාරුවීම් ලබාදීමේදී වඩාත් ප්‍රමුඛතාවය දක්වන්නේ ප්‍රියමනාප නොවන ස්ථානවල දුෂ්කර හා අති දුෂ්කර සේවා ස්ථානවල සේවය කළ නිලධරයන්ටය.

5.10. ස්ථාන මාරුවීම් ඉල්ලීමේදී සහ අභියාචනා ඉදිරිපත් කිරීමේදී සළකා බලනු ලබන්නේ ඒ සඳහා සකස් කර හඳුන්වාදෙනු ලබන ආදර්ශ ආකෘති පත්‍ර අනුවම සකස් කළ අයදුම්පත් පිළිබඳව පමණි.

5.11. සෑම නිලධරයෙක් පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට පාසල්/ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වග බලා ගත යුතුය. සාවද්‍ය අසම්පූර්ණ තොරතුරු එවා ඇති බව හෙළි වුවහොත් ඒ පිළිබඳව අදාළ විදුහල්පති/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා එම ලැයිස්තු සකස් කළ හා හරි වැරදි බලන ලද නිලධරයන් වගකීමට බැඳී සිටින අතර ඔවුන් විනයානුකූල කටයුතුවලටද යටත් වේ.

5.12. මාරු කමිටුව මගින් පාසලෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබාදී ඇති නිලධරයන් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන සේ ඔවුන් මුදා හැරීමට කටයුතු කළ යුතුය. මෙම විධිවිධානවලට පටහැනිව කටයුතු කරන විදුහල්පති/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීම පිණිස අදාළ බලධරයා වෙත වාර්තා කරනු ලැබේ. වාර්ෂික ස්ථානමාරු නියෝගය අනුව නව රාජකාරි ස්ථානයෙහි වැඩ බාරගැනීම සඳහා නිදහස් කලද වැඩ බාරනොගෙන සිටින නිලධාරීන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩය ප්‍රකාරව විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

5.13. ස්ථාන මාරුවීම් ලැබූ නිලධරයන් නියමිත දින සිට නව සේවා ස්ථානයේ රාජකාරි කටයුතුවලට වාර්තා කර තිබියදීත් ඇතැම් පාසල් ප්‍රධානීන් විසින් අදාළ නිලධරයන් මුදා හැර නොමැති අවස්ථා වාර්තාවී ඇත. එවැනි අවස්ථා උද්ගත නොවීමට විදුහල්පති/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වගබලා ගත යුතු අතර එම නිලධරයන් මුදා නොහරින්නේ නම් තවදුරටත් වැටුප් ගෙවීම සම්බන්ධයෙන් ආයතන ප්‍රධානීන් විසින් වගකීම භාර ගත යුතුය.

5.14. ස්ථාන මාරුවීම් ලැබේ යයි අපේක්ෂා කරන නිලධරයන්ගේ රාජකාරි කටයුතු ආවරණය කිරීම සඳහා පූර්වයෙන් වෙනත් නිලධරයන් පුහුණු කර වාර්ෂික ස්ථාන මාරුවීම් නියමිත දිනට ක්‍රියාත්මක

කරවීමට ආයතන/පාසල් ප්‍රධානීන් විසින් කටයුතු කළ යුතුය. මෙවැනි කරුණු සම්බන්ධයෙන් පසුව කෙරෙන ඉල්ලීම් සළකා බලනු නොලැබේ.

5.15. ස්ථාන මාරුවීම් ලැබීමට ඉඩ ඇතැයි සිතන කිසියම් නිලධරයකු සේවා අවශ්‍යතාවය මත තවත් වර්ෂයක් තම පාසල තුල රඳවා ගත යුතු යැයි විදුහල්පති විසින් අදහස් කරන්නේ නම්, නිර්දේශිත අයදුම්පත්‍ර යොමු කරන අවස්ථාවේදීම එම අවශ්‍යතාවය පිළිබඳ පැහැදිලි කර අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ ඇතිව අධ්‍යාපන ලේකම් වෙත තම ඉල්ලීම ඉදිරිපත් කළ යුතු වේ. ඒ අනුව මාරු කමිටුවලට ඒ පිළිබඳව දැනුම්දී ක්‍රියා කරනු ඇත. එක් වතාවකදී මෙම අවස්ථාව ලබාදී ඇති නිලධරයෙකු සඳහා නැවත අවස්ථාවක් ලබා දෙනු නොලැබේ.

6. 2025 වාර්ෂික ස්ථාන මාරු කාල සටහන

| | කාර්යය | දිනය |
|---|---|---|
| 01 | සම්පූර්ණ කරන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ඉදිරිපත් කළ යුතු අවසාන දිනය | 2025 මාර්තු මස 14 දින හෝ පෙර |
| 02 | විදුහල්පති හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නිර්දේශ ඉදිරිපත් කළයුතු අවසාන දිනය | 2025 මාර්තු මස 21 දින හෝ පෙර |
| 03 | අදාළ බලධාරියා විසින් අයදුම්පත්‍ර ස්ථානමාරු කමිටුවට භාර දීම | 2025 මාර්තු මස 27 දින හෝ පෙර |
| 04 | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ යෝජනා අධ්‍යාපන ලේකම්ගේ අනුමැතියට භාර දීම | 2025 අප්‍රේල් මස 04 දින හෝ පෙර |
| 05 | යෝජිත ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කිරීම සහ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පත් කිරීම | 2025 අප්‍රේල් මස 05 දින හෝ පෙර |
| 06 | ස්ථාන මාරුවීම් පිළිබඳ සමාලෝචන කමිටුව සඳහා අභියාචනා භාර ගැනීමේ අවසන් දිනය | 2025 අප්‍රේල් මස 12 දින හෝ පෙර |
| 07 | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ අධ්‍යාපන ලේකම් වෙත ලිඛිතව භාර දීම. | 2025 අප්‍රේල් මස 24 දින හෝ පෙර |
| 08 | අවසාන වාර්ෂික ස්ථාන මාරුවීම් නියෝග නිකුත් කිරීම | 2025 අප්‍රේල් මස 26 දින හෝ පෙර |
| 09 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම | 2025 මැයි මස 11 දින හෝ පෙර |
| 10 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අභියාචනා තීරණ නිකුත් කිරීම | 2025 මැයි මස 26 දින හෝ පෙර |
| 11 | වාර්ෂික ස්ථාන මාරුවීම් නියෝග බලාත්මක කිරීම | 2025 මැයි මස 26 දින සිට |

7. වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම පිළිබඳ විස්තර

7.1 වාර්ෂික ස්ථාන මාරු යෝජනා පිළිබඳ කරුණු දැක්වීමට අවශ්‍ය නිලධරයන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 253(V) පරිදි 15 පරිශිෂ්ඨය ප්‍රකාරව ආයතන ප්‍රධානියා මඟින් තම ඉල්ලීම

අභිනියෝජිත බලධරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එහි පිටපතක් සෘජුවම අදාල බලධරයා වෙත අවශ්‍ය නම් ඉදිරිපත් කිරීමට ද අදාළ විදුහල්පතිවරයාට අවසර ඇත. ස්ථාන මාරුවක් ලද විදුහල්පති සේවයේ නිලධරයකු එම ස්ථාන මාරුවට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කළ අවස්ථාවක එම අභියාචනයට පිළිතුරක් ලැබෙන තෙක් දැනට සේවය කරන පාසලේ සේවය කිරීමට ඉඩ සළසා දිය යුතුය.

7.2 වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු තීරණ ලබාදීමෙන් පසු නැවත සිදු කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතීන්හි XVIII වන පරිච්ඡේදයේ 256 වගන්තියේ විධිවිධාන අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

8. නිලධරයන්ගේ වගකීම්

වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලැබූ සියලුම නිලධරයන් නියමිත දිනයේදී නව රාජකාරි ස්ථානය වෙත සේවය සඳහා වාර්තා කිරීමට බැඳී සිටී.

9. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති 257 හි I සිට VI වගන්තිවල සඳහන් විධිවිධාන බලපැවැත්වෙනු ඇත.

- ස්ථානමාරු ලද නිලධාරියා වර්තමාන සේවා ස්ථානයෙන් නිදහස් කළද නව සේවා ස්ථානයේ රාජකාරියට වාර්තා නොකළහොත් ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 31:1:14 වගන්තිය ප්‍රකාරව විනයානුකූලව කටයුතු කරනු ලැබේ.
- භාෂා පරිවර්තන අතර යම් අනනුකූලතාවයකදී සිංහල භාෂාවෙන් ඇති ලිපිය බලාත්මක වනු ඇත.
- මෙහි සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් අංක 2310/29 හා 2022.12.14 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

නාලක කලුවැව
ලේකම්